# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 150 — 1975 පෙබරවාරි 07 වැනි සිකුරාදා — 1975.02.07

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... ... | 91 | ආදායම හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| කනතුරු—ඇබෑර්තු ... ... ... | 92 | අය-වැය ලේඛන ... ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — | දේපල විකිණීම ... ... ... | 98 |
| අකුරු ව්‍යවස්ථා ... ... ... | 95 | මාර්ග කොමිටි දැන්වීම ... ... ... | — |
| පළාත් පාලන සභා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — | විවිධ දැන්වීම ... ... ... | 99 |


## පළාත් පාලන නිවේදන

### ගම්සභා ආඥාපනත

13 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

ගම්සභා ආඥාපනතේ (257 වැනි අධිකාරය) 13 (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරුන බලතල ප්‍රකාර කළුතර දිස්ත්‍රික්කයේ පළාත් පාලන සහකාර කොමසාරිස් මද්දුම බණ්ඩා හේරත් වන මම, කළුතර දිස්ත්‍රික්කයේ මුංවත්තබාගේ පත්තු බටහිර ගම්සභාවේ අංක 12 දරණ කොට්ඨාශයේ සභික ජී. ඩී. ඩබ්ලිව්. ජේ. කරුණාතිලක මහතා සභාවට දැන්වීමක් නොමැතිව පිළිවෙලින් සභාවේ රැස්වීම් වාර තුනකට වැඩි ගණනකට තමන් තෝරා පත් කර ගැනීමෙන් පසු නොපැමිණීම ගැන සෑහීමකට පත්ව කළුතර දිස්ත්‍රික්කයේ මුංවත්තබාගේ පත්තු බටහිර ගම්සභාවේ අංක 12 දරණ කොට්ඨාශයේ සභික ජී. ඩී. ඩබ්ලිව්. ජේ. කරුණාතිලක මහතා මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළකිරීමේ දින සිට තම සභික ධුරය අත්හරින ලද බව මෙයින් ප්‍රකාශ කරමි.

මද්දුම බන්ඩා හේරත්,
පළාත් පාලන සහකාර කොමසාරිස්, කළුතර.

1975 ජනවාරි මස 28 දින,
කළුතර, පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ දී ය.

2–49—75.02.07 දින අංක 150 දරණ ගැසට් පත්‍රය

---

### ගම්සභා ආඥාපනතේ 13 වැනි වගන්තිය යටතේ දැන්වීම

1961 අංක 60 දරණ පනතින් සංශෝධිත ගම්සභා ආඥාපනතේ (257 වැනි අධිකාරය) 13 (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරුනු බලතල ප්‍රකාර බදුල්ල දිස්ත්‍රික්කයේ පළාත් පාලන සහකාර කොමසාරිස් තම්බිසායිබු අයිදුරුස් කමාල්දීන් වන මම, තල්දෙන ගම්සභාවේ අංක 6 දරණ කොට්ඨාශයේ නියෝජිත එච්. ඇම්. ආනන්ද සිරිසේන මහතා සභාවට දැන්වීමක් නොමැතිව පිළිවෙලින් සභා රැස්වීම් වාර තුනකට වැඩි ගණනක් තමන් තෝරා පත් කර ගැනීමෙන් පසු නොපැමිණි බව ගැන සෑහීමකට පත්ව බදුල්ල දිස්ත්‍රික්කයේ තල්දෙන ගම්සභාවේ අංක 6 දරණ කොට්ඨාශයේ සභික එච්. ඇම්. ආනන්ද සිරිසේන මහතා මේ දැන්වීම ගැසට් පත්‍රයේ පළ කිරීමේ දිනයේ සිට තම සභිකත්වය අත්හරින ලද බව මෙයින් ප්‍රකාශ කරමි.

ටී. අයි. කමාල්දීන්,
බදුල්ලේ පළාත් පාලන සහකාර කොමසාරිස්.

1975 ජනවාරි මස 20 වෙනි දින,
බදුල්ලේ, පළාත් පාලන දෙපාර්තමේන්තුවේ දීය.

2–69—75.02.07 දින අංක 150 දරණ ගැසට් පත්‍රය

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

**ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් භාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දැක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ. කුමන හේතුවක් නිසාවත් ප්‍රමාදවී ලැබෙන දැන්වීම් භාරගනු නොලැබේ.**

**1972 දෙසැම්බර් 15 වැනි දින,**
**රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,**
**කොළඹ.**

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්,**
**ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.**


91—B 71571—8,891 (75/1)

6. සේවාමුක්ත භටයින් සඳහා අනුග්‍රහ.—(අ) සේවාමුක්ත වූ අයදුම්කරුවනට, ඔවුන්ගේ නිත්‍ය හට හමුද සේවා කාලය, තම වයසින් අඩුකර ගැනීමෙන්, ඉල්ලුම්කර ඇති තනතුරුවල නියමිත උපරිම වයස් සීමාව ඇතුළතට පැමිණිය හැකිවන අවස්ථාවක නිත්‍ය හට සේවා කාලපරිච්ඡේදය එසේ අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

(ආ) සේවයේ යම්කිසි තනතුරක් සඳහා බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටිය නියමිත අඩුම අධ්‍යාපන සුදුසුකම්, ඊළඟට පහළින් ඇති විභාගය දක්වා අඩු කිරීමට සේවාමුක්තයන් වන අයදුම්කරුවනට අවසර දෙනු ලැබේ.

7. වයස පිළිබඳ අනුග්‍රහය.—පළාත් පාලන සේවයේ තනතුරු සම්බන්ධයෙන් පළකෙරෙන පුරප්පාඩු සඳහා වයස් සීමාවන් ගැන නොතකා අයදුම්පත් එවීමට ස්ථිර තනතුරක් දරණ, වර්ෂ දෙකක අඛණ්ඩ සේවාවක් ඇති ප්‍රාදේශීය බලමණ්ඩලයන්හි සේවකයන්ට පුළුවන.

8. වෙනත් අවශ්‍ය කරුණු.—(i) දනට පළාත් පාලන මණ්ඩලයක සේවයේ යෙදී සිටින නිළධාරීන් අයදුම්පත් තම තමන් සේවය කරන ප්‍රාදේශීය බලමණ්ඩල සභාපති මගින් හෝ නාගරික කොමසාරිස්වරයා මගින් හෝ ඉදිරිපත් කළ යුතුයි.

(ii) දනට ආණ්ඩුවේ සේවයෙහි යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම් පත් ඉදිරිපත් කළ යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන්ගේ මාර්ගයෙනි. ආණ්ඩුවේ සේවයේ ස්ථිර තනතුරු දරන නිලධාරීන් එවන අයදුම් පත් ඉදිරිපත් කිරීමේ දී, ඒ ඒ දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් විසින්ම එම අයදුම්කරුවන් තෝරාගනු ලැබුවහොත්, ඔවුන් ස්වකීය තනතුරු වලින් මුදවන්නට තමන් සූදානම්ව සිටිද්ද නැද්ද යි සඳහන් කළ යුතුය.

(iii) සම්මුඛ පරීක්ෂණයක් හෝ ලිඛිත පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක දන්වනු ලබන ස්ථානයකට පැමිණෙන ලෙස අපේක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකිය. මේ සම්බන්ධයෙන් කිසිම ගමන් වියදම් හෝ අන්කිසි වියදමක් හෝ ගෙවනු නොලැබේ.

(iv) කිසිම අපේක්ෂකයෙකු ගැන නිර්දේශයක් කිරීමට යම් කැනැත්තකුට වුවමනා නම්, ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයෙකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමක වුවද අයථා අනුග්‍රහයක් ලබාගැනීමකට හෝ බලපෑවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුවහොත්, ඒ හේතුවෙන්ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත් වන්නේය.

(v) යම් අයදුම්කරුවෙකුගේ අයදුම්පතෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන්කොට තිබෙන බැව් ඔහු තෝරාගැනීමට කලින් දනගන්නට ලැබුණි නම්, ඒ හේතුවෙන්ම එම තනතුරට නුසුදුස්සකු බවට පත්කරනු ලැබීමටත් තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුනි නම්, රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

(vi) මෙම දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නොගැලපෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(vii) පහත සඳහන් ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත (ඔහුගේ පෞද්ගලික නමට නොවේ) එවිය යුතුයි.

(viii) අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනයෙන් පසු මේ කාර්යාලයට ලැබෙන අයදුම්පත් සාමාන්‍යයෙන් සලකා බලනු නොලැබේ. අයදුම්පතක් තැපෑලේදී ප්‍රමාද වූ බවට හෝ නැතිවූ බවට කෙරෙන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ. අවසාන දිනය වනතුරු ස්වකීය අයදුම්පත් ඉදිරිපත් කිරීම ප්‍රමාද කරන අයදුම්කරුවෝ කුමුම ඒ අවදානමට මුහුණ පාති.

අනාගාරයකින් සඳහන් කොට නැති කල්හි භාවිත කළ යුතු අයදුම් පත් ආකෘතිය

පළාත් පාලන සේවය

සැ.යු.—(i) අයදුම් පත්‍ර පහත සඳහන් ආකෘතියෙහි පිළියෙලකොට තනතුරු අදළ වන ගැසට් නිවේදනයෙහි සඳහන්, අයදුම් පත්‍ර භාර ගන්නා අවසාන දින හෝ ඊට පළමු, කොළඹ 1, තැ.පෙ. 530, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන්නට එවිය යුතුයි. අයදුම් පත්‍ර ලේකම්ගේ පෞද්ගලික නමට නොඑවිය යුතුයි.

(ii) තනතුරු ඉල්ලා සිටීම සඳහා තමා සොකලායෙන්ම සුදුසු බැව් නිශ්චය කරනු පිණිස, තම අයදුම්පත්‍ර පිළියෙල කිරීමට පළමු ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසි හා ගැසට් නිවේදනයේ අවශ්‍යකාද සැළකිල්ලෙන් කියවා බලන ලෙස අයදුම්කරුවන්ට අවවාද කරනු ලැබේ. ගැසට් නිවේදනය බලා අදළ සියලුම තොරතුරු සැපයීමට අයදුම්කරුවන් වග බලාගත යුතුය.

(iii) පහත සඳහන් ලේඛනවල පිටපත්, අයදුම්කරුවන් ස්වකීය අයදුම් පත්‍රවලට ඇමිණිය යුතුය. (1) ඉංග්‍රීසි, සිංහල, දෙමළ යන භාෂාවලින් සමත්වී ඇති උසස්ම විභාගය පිළිබඳ සහතිකය, (2) චරිත සහතිකය, (3) ඉල්ලා සිටින තනතුර සම්බන්ධයෙන් අදලවන වෘත්තීය/ශිල්පීය සුදුසුකම් පිළිබඳ සහතිකය.

(iv) ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසිවල 8 වැනි ඡේදය කෙරෙහි විශේෂ සැලකිල්ල යොමු කරන්න.

.......................... තනතුර සඳහා වූ අයදුම් පත

1. (අ) පුරප්පාඩුව ප්‍රසිද්ධකොට ඇති ගැසට් පත්‍රයේ දිනය :————

(ආ) ඉල්ලුම්කර සිටින තනතුර :————.

2. සම්පූර්ණ නම පැහැදිලි අකුරෙන් :————.

ජාතිය :————

(ඔබ ලියාපදිංචි වීමෙන් ලාංකිකයෙකු වී නම්, පුරවැසිභාවය පිළිබඳ සහතිකයේ දිනයත්, සැදැහුම් අංකයත් සඳහන් කරන්න.)

3 තැපැල් ලිපිනය :————.

(ලිපිනය වෙනස් වූ වහාම ඒ බව දන්වා එවිය යුතුයි.)

4. (අ) අයදුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනයට නියම වයස :—

අවුරුදු :————. මාස :————. දින :————.

(ආ) උපන් දිනය :—

| අවුරුද්ද | මාසය | දිනය |
| --- | --- | --- |
| | | |

5. උපන් ස්ථානය :—

(අ) අයදුම්කරු :————.

(ආ) අයදුම්කරුගේ පියා :————.

(ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :————.

(ඈ) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මුත්තා :————.

(අයදුම්කරු ලංකාවේ උපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) හෝ (ඇ), (ඈ) යන දෙකම හෝ පිරවිය යුතුය. ඔහු ලංකාවේ නූපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) සහ (ඇ) හෝ (ඇ) සහ (ඈ) පිරවිය යුතුය.)

6 විවාහක ද ? අවිවාහක ද ? වැන්දඹු ද ? :————.

7. වයස අවුරුදු 12 සිට ඉගෙන ගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :—

| සාමාන්‍ය අධ්‍යාපනය | | |
| --- | --- | --- |
| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා |
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

වෘත්තීය/ශිල්පීය අධ්‍යාපනය

| විද්‍යායතනය | සිට | දක්වා |
| --- | --- | --- |
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

8. අධ්‍යාපනික සුදුසුකම් :—

(අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය/අ.පො.ස. (සාමාන්‍ය පෙළ)—

| | සමත් වූ වර්ෂය | විභාග අංකය | විෂයයන් | සම්මාන/විශිෂ්ය සාමාර්ථය |
| --- | --- | --- | --- | --- |
| පළමුවෙනි වාරය | | | | |
| දෙවැනි වාරය | | | | |

(ආ) අ. පො. ස. (උසස් පෙළ)—

| සමත් වූ වර්ෂය | විභාග අංකය | විෂයයන් | සම්මාන/විශිෂ්ට සාමාර්ථය |
|---|---|---|---|
| | | | |

(ඇ) වෙනත් උසස් අධ්‍යාපනික සුදුසුකම් :—

| විභාගයේ නම | සමත්වූ වර්ෂය | විභාග අංකය | විෂයයන් |
|---|---|---|---|
| | | | |

(ඈ) සමර්ථ වී ඇති උසස්ම විභාගය :—

(i) සිංහල :————.

(ii) දෙමළ :————.

(iii) ඉංග්‍රීසි :————.

9. ලබාගෙන ඇති වෘත්තිය සහ ශිල්පීය සුදුසුකම් ලැබූ දින හා ආයතනවල නම් :——

10. වෘත්තිය/කාර්මික/කර්මාන්ත පළපුරුද්ද :—

| ආයතනයේ නම | ආධුනිකත්වයේ ස්වභාවය/ දරූ තනතුර | සිට | දක්වා |
|---|---|---|---|
| | | | |

(සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි)

11. (අ) පාඨශාලාවෙන් අස් වූ දින සිට කළ රක්ෂා (පත් වූ දිනයන් හා අස් වූ දිනයන් දක්වමින් දරූ තනතුරු සඳහන් කරන්න) :————.

(ආ) මීට පළමු, ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලනායතනයක් යටතේ ස්ථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් හෝ රක්ෂාවෙහි යෙදී සිටියේ නම් සහ ඒ සේවය නතර කිරීමට ඇති හේතු හා එසේ කළ දින පැහැදිලි වශයෙන් දක්වන්න : ————.

(ඇ) පළාත් පාලන ආයතනවල සේවා කාලය පිළිබඳ සටහන් (තනතුරු, පළාත් පාලනායතන හා කාලසීමාවන් :————.

(ඈ) දැනට කරන රක්ෂාව—පහත සඳහන් විස්තර දෙන්න : —

(i) තනතුරේ පදවි නාමය, ශ්‍රේණිය හා ඊට පත්වූ දිනය ;————.

(ii) දීමනා හැර දැනට ලබන වැටුප හා වැටුප් ක්‍රමය :————.

(iii) විශ්‍රාම වැටුප් සහිතද ? :————.

(ඉ) සේවාමුක්ත භටයෙක් නම්—සේනාංකය, තරාතිරම, සේවයට බැඳුන දිනය හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

12. කියවීම, ලිවීම, කථාකිරීම, භාෂණ පරිවර්තනය පිළිබඳව ප්‍රවීණතාවක් ඇද්ද :—

(අ) සිංහල :————.

(ආ) දෙමළ :————.

13. විශෙෂ සුදුසුකම්.—ඉහත නිවේදනයෙහි සඳහන් නොවූ ඇති විශේෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට තිබේද ? එසේ නම්, ඒ පිළිබඳව සම්පූර්ණ විස්තර, දින වකවානු සහිතව සඳහන් කරන්න :————.

14. කිසියම් අපරාධ වරදක් සඳහා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේද ? එසේ නම් දිනය, නඩු අංකය හා වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.

15. මුදල් කරදරවලින් නිදහස්ද ? එසේ නැත්නම්, ඔබේ ණය බැඳීම්වල ප්‍රමාණය කොපමණ ද ? :————.

16. වෙනත් විස්තර (විශේෂ හිමිකම් ආදිය) :————.

17. චරිත සහතික ලබාගත් අයගේ නම් සහ පදවි නාම :————.

(ඉදිරිපත් කළ යුත්තේ ඒ සහතිකවල මුල් ලිපි නොව, පිටපත් පමණි. පළාත් පාලන සේවයේ උපලේඛනගත තනතුරු දරන සාමාජිකයින් විසින් මෙම නියමයේ ප්‍රකාර ක්‍රියා කළයුතු නොවේ.)

මෙම අයදුම් පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය බවත් නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් සොයාගනු ලැබීමට පළමු සොයාගනු ලැබුවහොත්, මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, පත්කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත්, වන්දියක් නොමැතිව මා සේවයෙන් පහකල හැකි බවත් මම දනිමි.

————.

දිනය :————. අයදුම්කරුගේ අත්සන.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්,
තැ.පෙ. 530, කොළඹ 1.

---

පළාත් පාලන සේවය

පරිපාලක (ඕවර්සියර්) තනතුරු

පළාත් පාලන සේවයේ ආදායම් හා කර්මාන්ත හා ජල කර්මාන්ත පරිපාලක තනතුරු සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති ලාංකිකයන් ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් මෙම ගැසට් පත්‍රයේ, පත් කිරීම් සම්බන්ධයෙන් අදාළ පොදු කොන්දේසිවලට යාකොට ඇති, ආකෘතියට අනුව පිළියෙල කොට, 1975.02.28 දිනට ප්‍රථම, මාවෙත ලියාපදිංචි තැපෑලෙන් ලැබෙන්නට සැලැස්විය යුතුය.

2. වැටුප් ක්‍රමය.—වර්ෂයකට රු. 3,000—11×90—රු. 3,990 ක ඒකාබද්ධ වැටුපක් මෙම තනතුරුවලට හිමිය. රු. 3,450 වැටුප් තලයට පෙර, කාර්යක්ෂමතා කඩඉමක් ඇත.

3. වයස් සීමාව.—75.01.15 දිනට අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 30 ට නොවැඩි විය යුතුයි. අනෙක් සෑම අතින්ම සුදුසුකම් ලබා ඇත්නම්, පළාත් පාලන ආයතනයක ස්ථිර තනතුරක් දරණ සේවකයෙකු සම්බන්ධයෙන් වයස් සීමාව බල නොපායි.

4. අවශ්‍ය අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :

4 : 1 ආදායම් හා කර්මාන්ත පරිපාලක තනතුරු සඳහා—

4 : 1 : 1 ගණිතය (අංක ගණිතය නොවේ) ඇතුළු විෂයයන් 5ක සම්මාන සාමාර්ථය සහිතව අ.පො.ස. (සාමාන්‍ය පෙළ) සමත් වී සිටිය යුතුය. (අවශ්‍ය සම්මාන ලබා ගැනීමද, සිංහල හෝ දෙමළ සමත්වීමද, යටත් පිරිසෙයින් විෂයයන් 6 කින් සමත්වීමද, දෙවරකදී වුවද සෑහේ) නැතහොත්—

4 : 1 : 2 ගණිතය හා සිංහල හෝ දෙමළ ඇතුළුව විෂයයන් 6 ක් එකවර හෝ දෙවරකදී අ.පො.ස. (සාමාන්‍ය පෙළ) සමත් වී පහත සඳහන් සුදුසුකම් දෙකින් එකක් ලබා තිබිය යුතුය.

4 : 1 : 3 රජයේ කාර්මික විද්‍යායතනයකින් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ප්‍රාථමික පරීක්ෂණයකින් සාමාර්ථය හෝ

4 : 1 : 4 සුළු ගොඩනැගිලි වැඩ, ප්‍රමාණය ගැනීම, පාරේ ගල් දැමීම හා තාරදැමීම ආදිය ගැන අවුරුදු දෙකක පළපුරුද්දක් තිබීම (මේ පළපුරුද්ද රජයේ හෝ පළාත් පාලන ආයතනයක හෝ පිළිගත් වෙළඳ සමාගමක විය යුතු අතර, ඒ පිළිබඳව සහතිකයක් ඉදිරිපත් කළ යුතුයි.)

4 : 2 ජල කර්මාන්ත පරිපාලන තනතුරු සඳහා :—

4 : 2 : 1 විෂයයන් 5 කට සම්මාන සහිතව සිංහල හෝ දෙමළ ඇතුළුව විෂයයන් 6 ක් එක්වර හෝ දෙවරකදී අ.පො.ස. (සා. පෙ.) සමත් වී,

4 : 2 : 2 ජලනල සවිකිරීම, නඩත්තු කිරීම හා ජල යෝජනා ක්‍රම ගැන රජයේ හෝ පළාත් පාලන ආයතනයක හෝ පිළිගත් වෙළඳ සමාගමක ලබාගත් පළපුරුද්දක් තිබිය යුතු අතර, ඒ පිළිබඳ සහතිකයක් ඉදිරිපත් කළ යුතුයි. නැතහොත්,

4 : 2 : 3 සිංහල හෝ දෙමළ ඇතුළුව විෂයයන් 6 ක් එක්වර හෝ දෙවරකදී අ.පො.ස. (සා. පෙ.) සමත් වී,

4 : 2 : 4 රජයේ කාර්මික විද්‍යායතනයකින් ලබාගත් ජලනල සවිකිරීම පිළිබඳ සහතිකය ලබා තිබිය යුතුය.

5. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි. මෙම තනතුර ස්ථිරය. පළාත් පාලන සේවා අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුවේ.

6. ආදායම් හා කර්මාන්ත පරිපාලකයින් වශයෙන් තෝරා ගනු ලබන අපේක්ෂකයින්ට ඔවුන්ගේ සාමාන්‍ය රාජකාරිවලට අමතරව ආදායම් කටයුතු හෝ සෞඛ්‍ය කටයුතු හෝ කරන ලෙසට නියම කළහොත් එසේ කිරීමට බැඳී සිටිය යුතුය.

7. මෙම ගැසට් පත්‍රයේ ආරම්භයේ පළකර තිබෙන, පළාත් පාලන සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන, පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරවනු ලැබේ.

8. අයදුම්පත්‍ර හා ඊට අදාළ සහතිකවල පිටපත් එවිය යුත්තේ පළාත් පාලන සේවා අධ්‍යක්ෂ වෙත මිස, මෙම දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොවේ.

9. නියමිත දිනට පසුව මෙම කාර්යාලයට ලැබෙන, රාජ්‍ය සේවයේ හෝ පළාත් පාලන සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත් භාරගනු ලබන්නේ, ඒවා අදාළ ආයතන ප්‍රධානියා වෙත, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පෙර ලැබී ඇති බවට සහතික කර, ප්‍රමාදයට හේතුවූ පිළිගත හැකි කරුණු දක්වමින්, ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණි.

10. සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත්‍ර පමණක් ලැබුණු බව දන්වා එවනු ලැබේ.

ආර්. අබේරත්න,
පළාත් පාලන සේවා අධ්‍යක්ෂ.

පළාත් පාලන සේවා දෙපාර්තමේන්තුව,
ගෆූර් ගොඩනැගිල්ල,
කොළඹ 1,
1975 ජනවාරි මස 15 වන දින.

2–124—75.02.07 දින අංක 150 දරණ ගැසට් පත්‍රය

---

# අතුරු ව්‍යවස්ථා

## ගම්සභා ආඥාපනත

(257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 42 වැනි වගන්තිය යටතේ මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර ගඟපළාත උතුර ගම්සභා ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්පාදිතව, ඒ වගන්තියේ (3) වැනි උප වගන්තියෙන් තමාවෙත පැවරී ඇති බලතල ප්‍රකාර රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව.

ඞී. රාජේන්ද්‍ර,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම්.

1975 ජනවාරි මස 21 වැනි දින,
කොළඹ දී ය.

### අතුරු ව්‍යවස්ථාව

මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර ගඟපළාත උතුර ගම්සභාව විසින් 1967. 09. 15 වැනි දින අංක 14,766 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ පලකොට පිළිගන්නා ලද පොදු අතුරු ව්‍යවස්ථාවල 28 කාණ්ඩයේ ජලසම්පාදන සේවය පිළිබඳව පොදු අතුරු ව්‍යවස්ථා, එහි 27 වැනි අතුරු ව්‍යවස්ථාවේ (2) වැනි ඡේදයට ඉක්බිතිව පහත සඳහන් අළුත් ඡේදය අන්තර්ගත කිරීමෙන් සභාවට අදාළ වනතාක් දුරට මෙයින් සංශෝධනය කරනු ලැබේ.

### ජල සැපයීමේ ගාස්තු

27 (3) (1) (අ) ගෘහ කාර්යයන් සඳහා වූ ජලය මීටරයකින් හෝ වෙන ආකාරයකින් සැපයිය හැකිය.

(ආ) ගෘහ කාර්යයන් සඳහා ජලය මීටරයකින් සැපයෙන අවස්ථාවක ඒ ජලය සඳහා ගාස්තුව පහත සඳහන් ගණන් ප්‍රමාණයන් අනුව අදාළ ස්ථානයේ අයිතිකරු හෝ පදිංචිකරු විසින් ගම්සභාව වෙත ගෙවිය යුතු ය.

එක් මසක් තුළදී සැපයෙන පළමු ගැලුම් 1,000ට අයකිරීමක් නැත. පළමු ගැලුම් 1,000ට අතිරේකව සැපයෙන සෑම ගැලුම් 1,000කට රු. 1.50 බැගින් ද,

(ඇ) ගෘහ කාර්යයන් සඳහා ජලය මීටරයකින් සපයනු නොලබන අවස්ථාවල පහත සඳහන් ගාස්තු මාසිකව සභාවට ගෙවිය යුතුයි.

(i) අඟල් ½ කරාමයක් සහිත ප්‍රථම කරාමය සඳහා මසකට රු. 4. 00 බැගින් ද,

(ii) ඊට අමතරව සපයනු ලබන එක් එක් කරාමය සඳහා මසකට රු. 1.00 බැගින් ද,

(2) (අ) ගෘහ කාර්යයන් නොවන වෙනත් කාර්යයන් සඳහා ජලය මීටරයකින් හෝ වෙන ආකාරයකින් සැපයිය හැකි ය.

(ආ) ගෘහ කාර්යයන් නොවන වෙනත් කාර්යයන් සඳහා ජලය සපයනු ලබන විට පහත සඳහන් ගාස්තු සභාවට ගෙවිය යුතුය.

(i) මීටර සවිකරනු ලැබුවහොත් ගැලුම් 1,000ට මසකට රු. 2.50 බැගින් ද,

(ii) මීටර සවිනොකරන ලද විට අඟල් ½ ප්‍රමාණයේ ප්‍රථම කරාමයට මසකට රු. 12. 00 ක් හා ඊට අමතරව එක් එක් කරාමය වෙනුවෙන් මසකට රු. 4. 00 බැගින් ද,

(iii) ජල මීටර් ගාස්තුව, අඟල් ½ මීටරයක් වූ විට රු. 4.00 ක් ද අඟල් 3/4 මීටරයක් වූවිට රු. 8.00 ක් ද මසකට ගෙවිය යුතුය.

(3) (අ) මහජන ආයතනයකට ජලය මීටරයකින් හෝ වෙනත් ආකාරයකින් සැපයිය හැකිය.

(ආ) එසේ සපයන ලද ජලය සඳහා පහත සඳහන් ගාස්තු සභාව වෙත මාසිකව ගෙවිය යුතු ය.

(i) මීටරයෙන් සපයනු ලැබූ විටක සෑම ගැලුම් 1,000 ටම රු. 1. 50 බැගින් ද

(ii) මීටරයෙන් සපයනු නොලැබූ විටක ප්‍රථම කරාමයට රු. 7. 50 බැගින් ද හා ඊට අමතරව සපයනු ලබන එක් එක් කරාමය සඳහා රු. 2. 50 බැගින් ද,

**සාමාන්‍ය අයකිරීම් :**

(4) ඉහත සඳහන් ගාස්තුවලට අතිරේකව, වරිපනම් බදු වලට යටත් නැති දේපොල වලින් එක් දේපොලකට, කාර්තුවකට රු. 1.50 බැගින් ගෙවිය යුතු ය.

2–43—75.02.07 දින අංක 150 දරණ ගැසට් පත්‍රය

---

## පණ්ඩතෙරුප්පු නගරය

### සුළු නගර සභා ආඥාපනත

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 152 සහ 156 වැනි වගන්ති යටතේ පණ්ඩතෙරුප්පු නගරයේ විශේෂ කොමසාරිස් විසින් සම්පාදිතව එකී ආඥාපනතේ 153 වැනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව.

ඞී. රාජේන්ද්‍ර,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ
අතිරේක ලේකම්.

1975 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ දී ය.

### පොදු වෙළඳ පොළවලට අදාළ අතුරු ව්‍යවස්ථාව

පණ්ඩතෙරුප්පු සුළු නගර සභාව විසින් පිළිගත්, සම්මත අතුරු ව්‍යවස්ථාවන්හි XV කාණ්ඩයේ 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා "වෙළඳ පල ප්‍රදේශය" යන්නෙන් පහත සඳහන් මායිම්වලින් විස්තර වෙන පණ්ඩතෙරුප්පු වෙළඳ පළේ සිට සැතපුම් භාගයක අර්ධ විෂ්කම්භය සහිත කවයක් ඇතුළත වූ ප්‍රදේශය අදහස් කෙරේ.

උතුරට : ඈස්. මුත්තයියා, සිවපාලන් රත්නම් මහත්මිය, බුවනේස්වරී නාගරාජා මහත්මිය සහ වේලුපිල්ලේ සරස්වතී මහත්මිය නමැති අයට අයත් ඉඩම ;

නැගෙනහිරට : ආර්. බී. තම්බයියා මහතාගේ ඉඩම සහ තෙලිප්පලේ-කීරිමලේ පාර ;

දකුණට : තෙලිප්පලේ-කීරිමලේ පාර ;

බටහිරට : පවුමාවත.

2–60—75.02.07 දින අංක 150 දරණ ගැසට් පත්‍රය

### මහරගම සුළු නගර සභාව

### සුළු නගර සභා ආඥාපනත

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 152 සහ 156 වැනි වගන්ති යටතේ මහරගම සුළු නගර සභාව විසින් සම්පාදිතව, එම ආඥාපනතේ 153 වැනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

ඩී. රාජේන්ද්‍ර,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම්.

1975 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ දීය.

### අතුරු ව්‍යවස්ථා

1. නව ගොඩනැගිලි සඳහා හෝ පවත්නා ගොඩනැගිලි වෙනස් කිරීම සඳහා හෝ (268 වැනි අධිකාරය වන) නිවාස හා නගර සංවර්ධන ආඥාපනතේ විධිවිධාන යටතේ ඉදිරිපත් කරනු ලබන සැලසුම් (ප්ලෑන්) පරීක්ෂා කිරීම හා සළකා බැලීම සම්බන්ධයෙන්, මෙහි වූ උපලේඛණයෙහි නිශ්චිත ප්‍රමාණ අනුව, තීරණය කරන ලද ගාස්තුවක් ගෙවිය යුතුය.

2. (i) 1 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ ගෙවිය යුතු ගාස්තුව මහරගම සුළු නගර සභාවේ සභාපතිගෙන් ගෙවීම් ඉල්ලුම ලැබී දින හතක් ඇතුළත අනුමැතිය හෝ අභිමතය සඳහා ඉල්ලුම් කල තැනැත්තා විසින් ගෙවිය යුතුය.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ පෙරාතුව වූ ඡේදයෙහි නියම කොට ඇති කාලය තුළ එබඳු ගාස්තුව ගෙවීමට අපොහොසත් වන සෑම තැනැත්තෙක්ම වරදකට වරදකරු විය යුතු අතර, එසේ වරදකරු වීමෙන් රුපියල් පනහකට වැඩි නොවන දඩයකට යටත් විය යුතුය.

3. අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ගාස්තුව ගෙවනතුරු කිසිම සැළසුමක් පරීක්ෂා කිරීම හෝ සළකා බැලීම නොකළ යුතුය.

### උපලේඛනය

1. නව ගොඩනැගිලි සඳහා හෝ පවත්නා ගොඩනැගිලිවලට අතිරේක බිම් ඉඩක් අවශ්‍ය වන වෙනස් කිරීම් සඳහා වූ සැලසුම්—

| | | රු. | ශ. |
|---|---|---|---|
| (අ) සමුච්චිත බිම් ඉඩ වර්ග අඩි 600 ට වැඩි නොවන කල්හි ගාස්තුවක් නැත. | | | |
| (ආ) සමුච්චිත බිම් ඉඩම් වර්ග අඩි 600 ට වැඩි නමුත් වර්ග අඩි 1,000 ට නොවැඩි කල්හි | ... | 10 | 0 |
| (ඇ) සමුච්චිත බිම් ඉඩම් වර්ග අඩි 1,000ට වැඩි නමුත් වර්ග අඩි 2,000 ට නොවැඩි කල්හි | ... | 25 | 0 |
| (ඈ) වර්ග අඩි 2,000 ඉක්මවන කල්හි | ... | 35 | 0 |
| 2. පවත්නා ගොඩනැගිලිවලට වෙනස් කිරීම් සඳහා අතිරේක බිම් ඉඩ අවශ්‍ය සැළසුම් සඳහා පවත්නා බිම් ඉඩ වර්ග අඩි 600 ට වැඩි වින කල්හි | ... | 10 | 0 |

මෙම උපලේඛනයෙහි "බිම් ඉඩ" යන්නෙන් බිම් මහලෙහි ඉඩ හෝ වෙනත් යම් මහලක ඉඩ අදහස් වේ.

2-55 —75.02.07 දින අංක 150 දරණ ගැසට් පත්‍රය

---

### නගර සභා ආඥාපනත

### සුළු නගර සභා ආඥාපනත

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥා පනතේ 152 වැනි සහ 156 වැනි වගන්ති යටතේ පුස්සැල්ලාව නගරයේ විශේෂ කොමසාරිස් විසින් සාදනු ලැබ, ඒ ආඥා පනතේ 153 වැනි වගන්තිය යටතේ රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

ඩී. රාජේන්ද්‍ර,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ
අතිරේක ලේකම්.

1975 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ දීය.

### අතුරු ව්‍යවස්ථා

මේ අතුරු ව්‍යවස්ථා 1975 පුස්සැල්ලාව නගරයේ ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථා යනුවෙන් හැඳින්විය යුතුය.

2. කිසියම් වීථියක, පාරක, ඇලක හෝ වැවක සිට පෙනෙන පරිදි යම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම හෝ ප්‍රදර්ශනය කරවීම, ඒ සම්බන්ධයෙන් විශේෂ කොමසාරිස් විසින් නිකුත් කරන ලද අවසර පත්‍රයක බලය යටතේ මිස, කිසිම තැනැත්තෙකු විසින් නොකල යුතුය.

එසේ වුවද, මේ අතුරු ව්‍යවස්ථාවේ ඉහත කී විධිවිධාන පහත සඳහන් දැන්වීම් වලින් යම්කිසිවක් සම්බන්ධයෙන්, ඒ ප්‍රචාරක දැන්වීම ආලෝකමත් කොට ඇතහොත් හෝ ඉහලින් සවිකරන ලද සංඥා දැන්වීමක් වෙනොත්මිස, අදාල නොවිය යුතුය.

(අ) එකතුවන ශුද්ධ ලාභ පුණ්‍යාධාර කටයුතු සඳහා යෙදවීම පිණිස පවත්වන යම් විනෝද කටයුත්තකට අදාලව කෙරෙන යම් ප්‍රචාරක දැන්වීමක්,

(ආ) ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කොට තබා ඇති ස්ථානයේ පවත්වනු ලබන යම් විනෝද කටයුත්තකට අදාල වූ යම් ප්‍රචාරක දැන්වීමක්,

(ඇ) ආණ්ඩුව මගින් ප්‍රදර්ශනය කෙරෙන යම් ප්‍රචාරක දැන්වීමක්,

(ඈ) ආගමික, දේශපාලන හෝ වෙනත් ප්‍රසිද්ධ රැස්වීමකට අදාලව කෙරෙන ප්‍රචාරක දැන්වීමක්,

(ඉ) යම් ගොඩනැගිල්ලක ජනේලයක වූ ප්‍රචාරක දැන්වීමක්,

(ඊ) " බදු දීමට තිබේ " යන ප්‍රචාරක දැන්වීමක්,

(උ) " විකිනීමට තිබේ " යන ප්‍රචාරක දැන්වීමක්,

(ඌ) ගෘහ නාම තහඩුවත්,

(ඒ) ප්‍රමාණයෙන් වර්ග අඩි එකකට වැඩි නොවන, වෘත්තීය කාර්යයන් සඳහා පාවිච්චි කෙරෙන නාම තහඩුවක්,

(ඒ) වෙළඳාම් කටයුතු සඳහා පාවිච්චි කරන වාහනයක, වාහනය අයිතිකරුගේ නම සහ ලිපිනය ප්‍රදර්ශනය කෙරෙන ප්‍රචාරක දැන්වීමක්, සහ

(ඔ) ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශණය කෙරෙන ස්ථානයේ පවත්වාගෙන යනු ලබන වෙළඳාමකට හෝ ව්‍යාපාරයකට අදාලව කෙරෙන ප්‍රචාරක දැන්වීමක්.

3. (1) යම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශණය කිරීමට අවසර පත්‍රයක් ලබා ගැනීම සඳහා කෙරෙන සෑම ඉල්ලීමක්ම, සභාව විසින් සපයනු ලබන ආකෘති පත්‍රයෙහි ඒ ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශණය කිරීමට අදහස් කරන දිනයේ සිට යටත් පිරිසෙයින් දින හතකටවත් ප්‍රථම විශේෂ කොමසාරිස් වෙත ඉදිරිපත් කල යුතුය.

එසේ වුවද, විශේෂ අවස්ථාවලදී මේ ඡේදයේ ඉහත සඳහන් විධිවිධානවල නිශ්චිතව සඳහන් කාල සීමාව තුල ඉදිරිපත් කරනු නොලබන යම් ඉල්ලුම් පත්‍රයක් විශේෂ කොමසාරිස් විසින් භාරගත හැකිය.

(2) (1) වැනි ඡේදයේ සඳහන් සෑම ඉල්ලීමක් සමගම ඉල්ලුම්කරු විසින් ප්‍රදර්ශණය කිරීමට බලාපොරොත්තු වන ප්‍රචාරක දැන්වීමේ පිට පතක් සහ ඒ ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශණය කෙරෙන ස්ථානය දැක්වෙන සැලැස්මක් ඉදිරිපත් කල යුතුය.

(3) (1) වැනි ඡේදයේ සඳහන් ඉල්ලීමක් විශේෂ කොමසාරිස් විසින් අනුමත කරන විටකදී ඒ ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශණය කිරීම සඳහා අවසර පත්‍රයට, මෙහි වූ උපලේඛනයේ දක්වා ඇති ප්‍රමානයන් අනුව ගණන් බලන ලද ගාස්තුවක් ගෙවන ලෙස විශේෂ කොමසාරිස් විසින් ඉල්ලුම්කරුට විධාන කල යුතුය. ඒ ගාස්තුව ගෙවන තෙක් ඒ අවසර පත්‍රය ඉල්ලුම්කරු වෙත නිකුත් නොකල යුතුය.

4. (1) ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශණය කිරීම සඳහා අවසර පත්‍රයක් යම් තැනැත්තෙකු වෙත නිකුත් කළ අවස්ථාවක—

(අ) ඒ ප්‍රචාරක දැන්වීමේ සෑම පිටපතකම ඒ අවසර පත්‍රයේ අංකය සහ දිනය සඳහන් කරන ලෙස, හෝ

(ආ) ඒ අවසර පත්‍රය සඳහා ගාස්තුවක් ගෙවූ බවට සලකුනක් වශයෙන් ඒ ප්‍රචාරක දැන්වීමේ සෑම පිටපතක්ම විශේෂ කොමසාරිස් වෙත ඉදිරිපත් කරන ලෙස විශේෂ කොමසාරිස් විසින් ඒ තැනැත්තාට විධාන කළ යුතුය:—

(2) මෙම අතුරු ව්‍යවස්ථාවේ (1) වැනි ඡේදය යටතේ විශේෂ කොමසාරිස් විසින් යම් තැනැත්තෙකුට විධානයක් කෙළේද, ඒ සෑම තැනැත්තෙකු විසින් ම ඒ විධානය ඉෂ්ට කළ යුතුය.

5. කිසිම තැනැත්තෙකු විසින්—

(අ) සභාවේ වැඩ අධිකාරීන් විසින් අනුමත කරන ලද ආකාරයකට තනන ලද හා ගොඩ නගන ලද නෙරායන ප්‍රචාරක දැන්වීමක් වෙතොත් මිස, ගොඩනැගිලි සීමාවේ සිට තිරස් අතට, කෙලින් මැනීමෙන් පසුව යම් පාරක් හෝ වීථියක් උඩින් අඟල් හයකට වඩා දුර, නෙරායනසේ යම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශණය කරවීම.

(ආ) ප්‍රචාරක දැන්වීම් පාරේ මධ්‍යයේ සිට අඩුම වශයෙන් අඩි විසි පහක් ඈතින් පිහිටුවා ඇත්නම් මිස, ගොඩනැගිලි සීමාව නොමැති යම් ස්ථානයක ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශණය කිරීම,

(ඇ) පොලොවේ සිට අඩි විසිපහකට වඩා උස්වූ හෝ යම්කිසි වීථියක හෝ පාරකට උඩින් නෙරායන යම් දැන්වීම් පුවරුවක ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශණය කරවීම,

(ඈ) යම් වීථියක හෝ පාරකට යාබද ගොඩනැගිල්ලක මුහුනතට ඒ මුහුනතේ සීමාවලින් පිටතට නෙරා සිටිනසේ දික්වූ, නැතහොත් උසින් පදික වේදිකාවේ හෝ පොලොවෙහි මධ්‍යම සමතාවයේ සිට සංඥවේ යට මට්ටම දක්වා ඇති දුර ප්‍රමාණයෙන් සතරෙන් එකකට වඩා කිසිම තැනක් වැඩිවූ යම් වෙළඳ සැල් සංඥවක් සවිකරවීම හෝ එල්ලා තැබවීම ,

(ඉ) සභාවේ වැඩ අධිකාරී විසින් අනුමත කර නොමැති ආකාරයකට ඉහලින් සවිකර දැන්වීම් සංඥවක් සැදවීම හෝ ඉදිකරවීම නොකල යුතුය.

6. කිසිම තැනැත්තෙකු විසින් යම් ප්‍රසිද්ධ වන්දනීය ස්ථානයක, ප්‍රසිද්ධ උද්‍යානයක හෝ වැසිකිලියක හෝ යම් පාලමක, වීථියක, වීථි ලාම්පු කණුවක, විදුලි සංඥ හෝ ටැලිපෝන් කණුවක හෝ විදුලි බල මාර්ග කණුවක කිසියම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශණය කරවීම නොකල යුතුය.

7. (1) යම් ප්‍රචාරක දැන්වීමක් විශේෂ කොමසාරිස්ගේ අදහස් අනුව අශෝභන හෝ නොනිසි තත්ත්වයක තිබේ නම් ඔහු විසින් ලියවිල්ලකින් කරනු ලබන දැන්වීමක් මගින් ඒ දැන්වීමේ නියමිත කාලය තුල ඒ ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශණය කිරීම නතර කරන ලෙස එය ප්‍රදර්ශණය කරවන තැනැත්තාට අණකල හැකිය.

(2) විශේෂ කොමසාරිස් විසින් (1) වැනි ඡේදය යටතේ දැන්වීමක් භාර දෙනු ලැබූ තැනැත්තෙකු විසින් එම දැන්වීමේ නියමිත කාලය ඇතුලතදී ඒ දැන්වීම අනුව ක්‍රියා කල යුතුය.

8. ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශණය කරවීම සඳහා පාවිච්චි කරනු ලබන යම් දැන්වීම් පුවරුවක අයිතිකරු හෝ බදුකරු විසින්—

(අ) එම දැන්වීම් පුවරුව නිසි පරිදි අළුත් වැඩියා කර සුරක්ෂිත තත්ත්වයක පවත්වාගෙන යායුතුය, තවද

(ආ) තමාගේ නම සහ ලිපිනය පහසුවෙන් කියවිය හැකි පැහැදිලි අකුරෙන් ඒ දැන්වීම් පුවරුවේ ඉදිරි පසින් ප්‍රකට ස්ථානයක, පෙන්නුම් කල යුතුය.

9. යම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමේ අවසර පත්‍රය සඳහා මුදල ගෙවූ බවට සලකුණක් වශයෙන් විශේෂ කොමසාරිස් විසින් එම දැන්වීමේ තබන ලද යම් සංඥවක්, සලකුණක්, අකුරක්, වචනයක් හෝ ඉලක්කමක් විකෘති කිරීම හෝ විකෘති කරවීම කිසිම තැනැත්තෙකු විසින් නොකළ යුතුය.

10. කිසිම තැනැත්තෙකු විසින්—

(අ) විශේෂ කොමසාරිස් විසින් අනුමත කරන ලද ආකාරයකට හෝ රූපයකට වෙනස් අයුරින් යම් ප්‍රචාරක දැන්වීමක් වාහනයක ප්‍රදර්ශනය කරවීමට සැලැස්වීම, හෝ

(ආ) පොලිස් අධිකාරි විසින් අනුමත කළ ආලෝකමත් ප්‍රචාරක දැන්වීමක් හැර වෙනයම් ආලෝකමත් ප්‍රචාරක දැන්වීමක් ඇති යම් වාහනයක් යම් වීථියක හෝ පාරක පදවාගෙන යාමට සැලැස්වීම

නොකළ යුතුය.

11. මෙම අතුරු ව්‍යවස්ථාවල විධිවිධානවලින් යමක් කඩ කරමින් කටයුතු කරන යම් තැනැත්තෙකු වරදකට වරදකරු විය යුතු අතර, වරදකරු වීමේදී රුපියල් පනහකට වැඩි නොවන දඩයකට යටත් විය යුතුවත් හැර ඒ කඩ කිරීම දිගටම සිදු කරන අවස්ථාවකදී එසේ වරදකරු කිරීමෙන් පසු හෝ ඒ කඩ කිරීම සම්බන්ධයෙන් අවධානය යොමු කොට විශේෂ කොමසාරිස් විසින් ලියවිල්ලකින් කරනු ලබන දැන්වීමක් භාරදීමෙන් පසුව ඒ වරද සිදු කරන සෑම දිනයක් සම්බන්ධයෙන්ම රුපියල් විසිපහකට නොවැඩි තවත් දඩයකටද යටත් විය යුතුය.

12. පද සම්බන්ධයෙන් අන්‍ය අර්ථයන් අවශ්‍ය වුවහොත් මිස් මෙම අතුරු ව්‍යවස්ථාවල ''ප්‍රචාරක දැන්වීම්'' යන්නට ප්‍රචාරක දැන්වීමක භාව යේවූද නැතහොත් ප්‍රචාරක කාර්යයන් සඳහා සම්පූර්ණයෙන් හෝ කොටස් වශයෙන් පාවිච්චි කරනු ලබන්නාවූද, යම් ඉඩමක, ගොඩනැගිල්ලක හෝ ඉදි කිරීමක දක්වෙන්නාවූද නැතහොත් එහි රඳවා ඇත්තාවූද, යම් වචනයක් අකුරක්, අංකයක්, සංඥවක්, දැන්වීම් කොලයක්, බෝඩ් එකක්, දැන්වීමක්, උපක්‍රමයක්, ආදර්ශනයක් හෝ නිරූපණයක් ඇතුළත් වේ.

''විශේෂ කොමසාරිස්'' යන්නෙන් පුස්සැල්ලාව නගරය සඳහාවූ විශේෂ කොමසාරිස් අදහස් වේ. ''දැන්වීම් පුවරුව'' යන්නෙන් යම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමේ කාර්යය සඳහා ඉදිකර ඇති හෝ ප්‍රයෝජනයට ගන්නා යම් ඉදි කිරීමක්, ආධාරකයක්, කනුවක්, පුවරුවක්, තාප්පයක්, දැන්වීම් පෙට්ටියක් හෝ වෙනත් උපක්‍රමයක් අදහස් වේ. තවද ''ඉහළින් සවි කරන දැන්වීම් සංඥව'' යන්නෙන් යම් වීථියක, මාර්ගයක, ඇලක හෝ වැවක යම් තැනක සිට බැලූ විට සම්පූර්ණ වශයෙන් හෝ කොටස් වශයෙන් අහස පසුබිම් කොට පෙනෙන පරිදි යම් ඉඩමක, ගොඩනැගිල්ලක හෝ වෙනත් ඉදි කිරීමක හෝ එබන්දකට උඩින් දක්වෙන කනුවකට, පිට තට්ටු ද්වාරයකට, රාමුවකට හෝ වෙනත් උපස්ථම්භයකට සවි කරන ලද ප්‍රචාරය කිරීමේ කාර්යය සඳහාවූ යම් වචනයක්, අකුරක්, ආදර්ශනයක්, සංඥවක්, උපක්‍රමයක් හෝ නිරූපණයක් අදහස් වන අතර, ප්‍රචාරය කිරීම සඳහා සම්පූර්ණ වශයෙන් හෝ කොටස් වශයෙන් යම් ඉඩමක, ගොඩනැගිල්ලක, ඉදි කිරීමක, වීථියක හෝ මාර්ගයක හෝ එබන්දකට උඩින් පාවිච්චි කරනු ලබන යම් බැලූනයක්, පැරචූටයක්, ට්‍රෙලර් එකක් හෝ වෙනත් එබඳු උපක්‍රමයක් එයට ඇතුළත් වේ.

## උපලේඛනය

| ප්‍රචාරක දැන්වීමේ විස්තරය | අවසර පත්‍ර සඳහා ගාස්තු | | |
|---|---|---|---|
| | සති දෙකක් සඳහා | මාස එකක් සඳහා | අවුරුදු එකක් සඳහා |
| | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| 1. බිත්තියක හෝ දැන්වීම් පුවරුවක ප්‍රදර්ශණය කර ඇති දිගින් අඩි 3 කට සහ පළලින් අඩි 2 කට නොවැඩි (සිනමා චිත්‍රපටි ප්‍රදර්ශණයට අදල වූ ප්‍රචාරක දැන්වීමක් නොවන) ප්‍රචාරක දැන්වීමකට එක් එක් වර්ග අඩිය සඳහා ... ... ... ... | 0 15 ... | 0 25 ... | 2 50 |
| 2. බිත්තියක හෝ දැන්වීම් පුවරුවක ප්‍රදර්ශණය කර ඇති දිගින් අඩි 3 කට සහ පළලින් අඩි 2 කට වැඩි (සිනමා චිත්‍රපටි ප්‍රදර්ශණයකට අදල වූ ප්‍රචාරක දැන්වීමක් නොවන) ප්‍රචාරක දැන්වීමකට එක් එක් වර්ග අඩිය සඳහා ... ... ... ... | 0 25 ... | 0 50 ... | 5 0 |
| 3. සිනමා චිත්‍රපටි ප්‍රදර්ශණයකට අදල වූ යම් ප්‍රචාරක දැන්වීමකට එක් එක් වර්ග අඩිය සඳහා ... | 0 50 ... | 1 0 ... | 10 0 |
| 4. යම් තැනැත්තකු විසින් රැගෙන යන්නා වූ හෝ ධාවනය වන වාහනයකට සම්බන්ධ කර තිබෙන්නාවූ බෝඩ් එකක හෝ ධාරකයක ප්‍රදර්ශණය කර ඇති (සිනමා චිත්‍රපටි ප්‍රදර්ශණයකට අදල වූ ප්‍රචාරක දැන්වීමක් නොවන) ප්‍රචාරක දැන්වීමක්— | | | |
| (අ) එම ප්‍රචාරක දැන්වීම දිගින් අඩි 3 කට සහ පළලින් අඩි 2 කට නොවැඩිවන විම එක් එක් වර්ග අඩිය සඳහා ... ... ... ... | 0 50 ... | 1 0 ... | 10 0 |
| (ආ) එම ප්‍රචාරක දැන්වීම දිගින් අඩි 3 කට සහ පළලින් අඩි 2 කට නොවැඩි වන විට එක් එක් වර්ග අඩිය සඳහා ... ... ... ... | 1 0 ... | 2 0 ... | 20 0 |
| (ඇ) එක් එක් මාසය සඳහා හෝ කොටසක් සඳහා ප්‍රචාරක ධජයකට ... ... | — ... | — ... | 25 0 |

2–64—75.02.07 දින අංක 150 දරණ ගැසට් පත්‍රය

### මොනරාගල නගරය

### සුළු නගර සභා ආඥාපනත

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 152 සහ 156 වැනි වගන්තීන් යටතේ මොනරාගල නගරයේ විශේෂ කොමසාරිස් විසින් සාදන ලදුව එම ආඥාපනතේ 153 වැනි වගන්තිය යටතේ රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව.

ඩී. රාජේන්ද්‍ර,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ
අතිරේක ලේකම්.

1975 ජනවාරි මස 22 දින,
කොළඹ දීය.

### ගොඩනැගිලි සැලසුම්පත් පරීක්ෂා කිරීම හා සලකා බැලීම සම්බන්ධයෙන් අදාළ අතුරු ව්‍යවස්ථාව

1. අළුතින් ගොඩනැගිලි ඉදිකිරීම සඳහා හෝ දැනට තිබෙන ගොඩනැගිලි වෙනස් කිරීම සඳහා හෝ (268 අධිකාරය වන) නිවාස හා නගර සංවර්ධන ආඥාපනතේ විධිවිධාන යටතේ අනුමත කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන අයදුම්පත්, සැලසුම්පත්, චිත්‍ර සටහන් සහ වැඩ විස්තර පත්‍රිකා පරීක්ෂාකර බැලීම හා සලකා බැලීම සම්බන්ධයෙන් මෙහි වූ උපලේඛනයේ නිශ්චිත ලෙස සඳහන්ව ඇති ගාස්තු ප්‍රමාණයන් අනුව නිගමනය කරනු ලබන ගාස්තුවක් ගෙවිය යුතුය.

2. (i) 1 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ ගෙවිය යුතු ගාස්තුව ගෙවන ලෙස නියම කරමින් මොනරාගල නගරයේ විශේෂ කොමසාරිස්වරයාගෙන් හෝ සභාපතිගෙන් ලිපියක් ලද දින සිට දින 7 ක් (හතක්) ඇතුළත දී විශේෂ කොමසාරිස්ගේ හෝ සුළු නගර සභාවේ අනුමැතිය හෝ කැමැත්ත සඳහා අයදුම්පත ඉදිරිපත් කරන තැනැත්තා විසින් එම ගාස්තුව ගෙවිය යුතුය.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ පූර්වෝක්ත ඡේදයෙහි නියම කර ඇති කාල සීමාව ඇතුළත දී එකී ගාස්තුව ගෙවීමට අපොහොසත් වන සෑම තැනැත්තෙක්ම වරදකට වරදකරු විය යුතු අතර, එසේ වරදකරු කරනු ලැබීමේදී රුපියල් සියයකට නොවැඩි දඩයක් ගෙවීමට ඔහු යටත් විය යුතුය.

3. අතුරු ව්‍යවස්ථාවල සඳහන් ගාස්තුව ගෙවනු ලබන තෙක් කිසිදු අයදුම්පතක්, සැලසුම්පතක්, චිත්‍ර සටහනක් හෝ වැඩ විස්තර පත්‍රිකාවක් පරීක්ෂාකර බැලීම හෝ සලකා බැලීම නොකළ යුතුය.

### උපලේඛනය

1. අළුතින් ගොඩනැගිලි ඉදිකිරීම සඳහා හෝ දැනට පවතින ගොඩනැගිලිවල ගෙබිමේ වර්ග ප්‍රමාණය විශාල වන අයුරු එය වෙනස් කිරීම සඳහා හෝ ඉදිරිපත් කෙරෙන සැලසුම්පත් සම්බන්ධයෙන් :—

| | රු. | ශ. |
|---|---|---|
| (අ) ගෙබිමේ සම්පූර්ණ ප්‍රමාණය වර්ග අඩි 600 කට වැඩි නොවන කල්හි ... ... | 3 | 0 |
| (ආ) ගෙබිමේ සම්පූර්ණ ප්‍රමාණය වර්ග අඩි 600 කට වැඩි වන නමුදු වර්ග අඩි 1,000කට වැඩි නොවන කල්හි ... ... ... | 7 | 0 |
| (ඉ) ගෙබිමේ සම්පූර්ණ ප්‍රමාණය වර්ග අඩි 1,000 කට වැඩි වන නමුදු වර්ග අඩි 3,000කට වැඩි නොවන කල්හි ... ... ... | 20 | 0 |
| (ඊ) ඊට අමතර වශයෙන් වන සෑම වර්ග අඩි 1,000 ක ඒකකයකට හෝ ඉන් කොටසකට ... | 5 | 0 |
| 2. දැනට පවතින ගොඩනැගිල්ලක ගෙබිමේ ප්‍රමාණය විශාල නොවන අයුරින් එම ගොඩනැගිල්ල වෙනස් කිරීම සඳහා ඉදිරිපත් කෙරෙන සැලසුම්පත් ... | 5 | 0 |
| 3. සැලසුම්පත් අළුතින් ඉදිරිපත් නොකර අනුමැතිය අළුත් කර ගැනීම සඳහා ඉදිරිපත් කෙරෙන අයදුම්පතක් වෙනුවෙන් ... ... | 10 | 0 |
| 4. ගොඩනැගිලි අවසර පත්‍රයක වලංගු කාල සීමාව දීර්ඝ කර ගැනීම සඳහා ඉදිරිපත් කෙරෙන අයදුම්පතක් වෙනුවෙන් ... ... ... | 3 | 0 |

මෙම උපලේඛනයේ "ගෙබිමේ ප්‍රමාණය" යනුවෙන් බිම් මාලයෙහි හෝ වෙනත් මාලයක බිම් ප්‍රමාණය අදහස් කෙරේ.

2–193—75.02.07 දින අංක 150 දරණ ගැසට් පත්‍රය

## දේපල විකිණීම්

### පස්සර සුළු නගර සභාව

ගිහ වරිපනම් බදු නොගෙවීම නිසා නිශ්චල දේපල විකිණීම

1964 සිට 1974 අවසානය දක්වා මෙහි පහත දක්වා ඇති උපලේඛනයේ සඳහන් දේපළ සම්බන්ධයෙන්, ලැබිය යුතු ගිහ වරිපනම් බදු අයකර ගැනීමට තහනම් කිරීම සඳහා චංචල දේපල නොමැති වූ කල්හි 256 වන අධිකාරය වන සුළු නගර සභා ආඥාපනතේ 169 (1) වගන්තිය සමග කියවෙන 252 අධිකාරය වන මහ නගර සභා ආඥාපනතේ 252 ඡේදයේ ප්‍රකාර මා විසින් නිකුත් කරන ලද වරෙන්තුවක බලය පිට තහනම් කරන ලද (1) කුලී සහ ලාභ (2) ඇව හා උපදින ද්‍රව්‍යය (3) ගෙයි උපකරණ (4) පහත සඳහන් දේපලම ඒ දේපොලවලින් ලැබිය යුතු වරිපනම් බදු හා වරෙන්තු ගාස්තු යථාකාලයේදී ගෙවනු නොලැබුවහොත්, පහත උපලේඛනයේ සඳහන් දිනයන්හි පෙරවරු 9 සිට ආරම්භ කොට එකී දේපල පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

ඇම්. ජී. සනී,
ලේකම්,
පස්සර සුළු නගර සභාව.

1975 ක් වූ ජනවාරි මස 21 දින,
පස්සර, සුළු නගර සභා කාර්යාලයේ දී ය.

### උපලේඛනය

කොට්ඨාශ අංක 1—බදුලු-මඩකලපු පාර : 157 ; ගන්ක්ලබ් පාර : 5.

කොට්ඨාශ අංක 2—බදුලු මඩකලපු පාර : 208/2, 208 ; සඟබෝ මාවත : 60.

කොට්ඨාශ අංක 3—සඟබෝ මාවත : 14, 261.

කොට්ඨාශ අංක 4—දමේරියා පාර : 11/8, 26, 11/4 ; බදුලු-මඩකලපු පාර : 310.

කොට්ඨාශ අංක 5—පරාක්‍රම මාවත : 10 ; දමේරියා පාර : 28, 4, 2.

කොට්ඨාශ අංක 6—බදුලු-මඩකලපු පාර : 486.

කොට්ඨාශ අංක 7—බදුලු-මඩකලපු පාර : 425 ; පාසැල් පටු මග : 9.

අංක 1 සිට 4 දක්වා කොට්ඨාශ 1975 මාර්තු 20 දිනද,

අංක 5 සිට 7 දක්වා කොට්ඨාශ 1975 මාර්තු 25 දිනද.

2–75—75.02.07 දින අංක 150 දරණ ගැසට් පත්‍රය

### කඩුගන්නාව නගර සභාව

ගිහ වරිපනම් නොගෙවීම නිසා නිශ්චල දේපල විකිණීම

1974/2 වැනි කාර්තුව දක්වා, මීට යාව ඇති උපලේඛනයේ සඳහන් දේපල සම්බන්ධයෙන් ලැබිය යුතු ගිහ වරිපනම් බදු අයකර ගැනීම පිණිස තහනමට ගැනීමට චංචල දෙපල නොමැති වූ හෙයින්, 255 අධිකාරය වන නගර සභා ආඥාපනතේ 170(1) 170(2) යන ඡේදයන් සමග කියවෙන 252 වන අධිකාරය වන මහ නගර සභා ආඥාපනතේ 252 ඡේදය ප්‍රකාර මා විසින් නිකුත් කරන ලද වරෙන්තුවක බලය පිට තහනම් කරන ලද (1) කුලී සහ ලාභ/ (2) දූව සහ උපදින ද්‍රව්‍ය (3) ගොඩනැගිලි සහ උපකරණ සහ පහත සඳහන් වන දේපලම ඒ ඒ දේපල වෙනුවෙන් අයවිය යුතු වරිපනම් බදු හා වරෙන්තු ගාස්තු යථා කාලයේදී ගෙවනු නොලැබුවහොත් පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති දිනයන්හිදී පෙ. ව. 9 ට හෝ ඊට පසුව ආරම්භ කොට, එකී දේපල පිහිටි ස්ථානයේදීම ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

බී. දිසානායක,
ලේකම්,
කඩුගන්නාව නගර සභාව.

1975 ජනවාරි මස 16 වැනි දින,
කඩුගන්නාව නගර සභා කාර්යාලය.

### උපලේඛනය

කොට්ඨාශ අංක 3—1975. 3. 10
නුවර පාර අංක : 40.
කොට්ඨාශ අංක 4—1975. 3. 10
නුවර පාර අංක : 66, 198(ඒ), 200, 202.
කොට්ඨාශ අංක 6—1975. 3. 11
නුවර පාර අංක : 273, 275, 293, 365(ඒ).

2–141—75.02.07 දින අංක 150 දරණ ගැසට් පත්‍රය

# විවිධ දැන්වීම්

## කුරුණෑගල දිස්ත්‍රික්කයේ පන්නල ගම්සභාව

### මස් පිණිස සතුන් මැරීම පිළිබඳ ආඥාපනත

මෙහි පහත උපලේඛනයේ සඳහන් අය එහි සඳහන් ස්ථානවල 1975 වර්ෂයට මස් කඩ පවත්වාගෙන යාමට බලපත්‍ර ඉල්ලුම් කර තිබෙන බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීම ගැන කුරුණෑගල දිස්ත්‍රික්කයේ පන්නල ගම්සභා සීමාව තුල පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් ඒ කුමන කරුණක් නිසාද යන වග ඇතුළත් ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පලවන දින සිට සති දෙකක් ඇතුලත ලියා එවීමට බලය තිබෙන බවත් මස් පිණිස සතුන් මැරීම පිළිබඳ ආඥාපනතේ (272 වැනි අධිකාරිය) අංක 7 (2) වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

| ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය | ස්ථානය |
|---|---|
| 1. ඇම්. ඒ. රත්නසේන, දූනකදෙණිය, වැලිපැන්නගහමුල්ල ... ... | ... යක්විල හරක් මස් කඩය |
| 2. ඇම්. ඒ. රත්නසේන, දූනකදෙණිය, වැලිපැන්නගහමුල්ල ... | ... පන්නල හරක් මස් කඩය |
| 3. ඕ. ඇල්. ඇම්. සුලෙයිමන්, ඇලබඩගම, පන්නල ... ... | ... ඇලබඩගම හරක් මස් කඩය |
| 4. ඕ. ඇල්. ඇම්. සුලෙයිමන්, ඇලබඩගම, පන්නල ... ... | ... බම්මන්න හරක් මස් කඩය |

ඩී. ඒ. ජී. සමරදිවාකර,
පාලන නිලධාරි,
පන්නල ගම් ප්‍රදේශය.

පන්නල ගම් ප්‍රදේශ පාලන කාර්යාලය,
යක්විල, 74.12.27.

2-127—75.02.07 දින අංක 150 දරණ ගැසට් පත්‍රය

---

## කුරුණෑගල දිස්ත්‍රික්කයේ පන්නල ගම්සභාව

### ගෝඝාතක ආඥාපනත

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 වැනි අධිකාරිය) 17(1) දරණ වගන්තියෙන් පැවරී තිබෙන බලය ප්‍රකාර නියමිත අධිකාරි තැනවූ පන්නල ගම් ප්‍රදේශයේ පාලන නිලධාරි, පහත දැක්වෙන උප ලේඛනයේ දැක්වෙන දිනයන්හි පන්නල ගම්සභා සීමාව තුල මස් පිණිස සතුන් මැරීම හා මස් විකිණීම සම්පූර්ණයෙන්ම තහනම් කරනු ලැබේ.

**උපලේඛනය**

| | | |
|---|---|---|
| 1975 ජනවාරි 27 | — | දුරුතු මස පුර පසලොස්වක පොහොය දිනය, |
| 1975 පෙබරවාරි 25 | — | නවම් මස පුර පසලොස්වක පොහොය දිනය, |
| 1975 මාර්තු 26 | — | මැදින් මස පුර පසලොස්වක පොහොය දිනය, |
| 1975 අප්‍රේල් 25 | — | බක් මස පුර පසලොස්වක පොහොය දිනය, |
| 1975 මැයි 22 | — | ජනරජ දිනය, |
| 1975 මැයි 24 | — | වෙසක් මස පුර පසලොස්වක පොහොය දිනය, |
| 1975 මැයි 25 | — | වෙසක් මස පුර පසලොස්වක පොහොය දිනට පසු දින, |
| 1975 ජූනි 23 | — | පොසොන් මස පුර පසලොස්වක පොහොය දිනය, |
| 1975 ජූලි 22 | — | ඇසල මස පුර පසලොස්වක පොහොය දිනය, |
| 1975 අගෝස්තු 21 | — | නිකිණි මස පුර පසලොස්වක පොහොය දිනය, |
| 1975 සැප්තැම්බර් 19 | — | බිනර මස පුර පසලොස්වක පොහොය දිනය, |
| 1975 සැප්තැම්බර් 26 | — | බණ්ඩාරනායක සමරු දිනය, |
| 1975 ඔක්තෝබර් 4 | — | ලෝක සත්ව දිනය, |
| 1975 ඔක්තෝබර් 19 | — | වප් මස පුර පසලොස්වක පොහොය දිනය, |
| 1975 නොවැම්බර් 18 | — | ඉල් මස පුර පසලොස්වක පොහොය දිනය, |
| 1975 දෙසැම්බර් 18 | — | උඳුවප් මස පුර පසලොස්වක පොහොය දිනය. |

ඩී. ඒ. ජී. සමරදිවාකර,
පාලන නිලධාරි,
පන්නල ගම් ප්‍රදේශය.

1974 දෙසැම්බර් මස 27 වැනි දින,
පන්නල ගම් ප්‍රදේශ පාලන කායර්‍යාලය,
යක්විල.

2–128—75.02.07 දින අංක 1 0 දරණ ගැසට් පත්‍රය

---

## මාතර දිස්ත්‍රික්කයේ ගොඩපිටිය ගම්සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (ලංකා නීති ප්‍රඥප්ති සංග්‍රහයේ 272 වන අධිකාරිය)

### 17 (1 වන) ඡේදය යටතේ නියෝගය

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (ලංකා නීති ප්‍රඥප්ති සංග්‍රහයේ 272 වන අධිකාරිය) 17(1) වන ඡේදය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නියමිත අධිකාරිය වූ ද, ගොඩපිටිය ගම්සභාවේ සභාපති ඩී. ජේ. ඇම්. ගුණවර්ධන වන මම, 1975 වර්ෂයේ මෙහි දැක්වෙන උප ලේඛනයේ සඳහන් වන දිනයන් හිදී, ගොඩපිටිය ගම්සභා සීමාව තුළ මස් පිණිස සතුන් මැරීම හා මස් වෙළඳාම මෙයින් සපුරා තහනම් කරමි.

ඩී. ජේ. ඇම්. ගුණවර්ධන,
ගොඩපිටිය ගම්සභාවේ,
සභාපති තැන.

1975 ජනවාරි මස 25 වන දින,
අකුරැස්සේ–විල්පිට,
ගොඩපිටිය ගම්සභා කාර්යාලයේ දීය.

**උපලේඛනය**

| | | |
|---|---|---|
| 1975 ජනවාරි මස 27 | — | දුරුතු පුර පසළොස්වක් පෝ ද, |
| 1975 පෙබරවාරි මස 25 | — | නවම් පුර පසළොස්වක් පෝද, |
| 1975 මාර්තු මස 26 | — | මැදින් පුර පසළොස්වක් පෝද, |
| 1975 අප්‍රේල් මස 25 | — | බක් පුර පසළොස්වක් පෝද, |
| 1975 මැයි මස 22 | — | ජනරජ දින ද, |
| 1975 මැයි මස 24 | — | වෙසක් පුර පසළොස්වක් පෝද, |
| 1975 මැයි මස 25 | — | වෙසක් පුර පෝදට පසුද, |
| 1975 ජූනි මස 23 | — | පොසොන් පුර පසළොස්වක් පෝද, |
| 1975 ජූලි මස 22 | — | ඇසළ පුර පසළොස්වක් පෝද, |
| 1975 අගෝස්තු මස 21 | — | නිකිණි පුර පසළොස්වක් පෝද, |
| 1975 සැප්තැම්බර් මස 17 | — | ශ්‍රීමත් අනගාරික ධර්මපාල දිනද, |
| 1975 සැප්තැම්බර් මස 19 | — | බිනර පුර පසළොස්වක් පෝද, |
| 1975 සැප්තැම්බර් මස 26 | — | ශ්‍රීමත් බණ්ඩාරණායක සමරු දිනද, |
| 1975 ඔක්තෝබර් මස 04 | — | සමස්ත ලෝක සත්ත්ව දිනයදා, |
| 1975 ඔක්තෝබර් මස 19 | — | වප් පුර පසළොස්වක් පෝද, |
| 1975 නොවැම්බර් මස 18 | — | ඉල් පුර පසළොස්වක් පෝද, |
| 1975 දෙසැම්බර් මස 18 | — | උඳුවප් පුර පසළොස්වක් පෝ ද. |

2–991—75.02.07 දින අංක 150 දරණ ගැසට් පත්‍රය

### කළුතර දිස්ත්‍රික්කයේ වාද්දූ-වස්කඩු බද්ද ගම්සභාව

#### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත දක්වෙන උපලේඛනයෙහි නම් සඳහන් අය විසින් එකී උපලේඛනයෙහි සඳහන් ස්ථානයෙහි 1975 වර්ෂයට මස් පිණිස සතුන් මරා විකිණීම සඳහා අවසර පත්‍රයක් ඉල්ලුම් කර තිබෙන බවත්, එම අවසර පත්‍රය නිකුත් කිරීම ගැන කළුතර දිස්ත්‍රික්කයේ වාද්දූ-වස්කඩු බද්ද ගම්සභා සීමාව තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම්, එසේ විරුද්ධවීමට හේතු සඳහන් කර පිටපත් දෙකකින් යුත්ලියවිල්ලක්, මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14ක් ඇතුළත මා වෙත ලියා එවිය යුතු බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 වැනි අධිකාරිය වන) 7 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාම | ස්ථානය |
|---|---|---|
| 1. ඒ. ඒ. සාහුල් හමීඩ් මයා., 2/68, මරික්කාර් වීදිය, කළුතර දකුණ ... | ... එළ හරක් මස් | ... මොරොන්තුඩුව |
| 2. ඒ. ඒ. සාහුල් හමීඩ් මයා., 2/68, මරික්කාර් වීදිය, කළුතර දකුණ ... | ... එළ හරක් මස් | ... මොල්ලිගොඩ |

ඩඩ්ලි විජේසේකර,
සභාපති,
වාද්දූ-වස්කඩු බද්ද ගම්සභාව.

1974.12.17 වැනි දින,
වාද්දූ-වස්කඩු බද්ද ගම්සභා කාර්යාලය,
වස්කඩුව.

2-130—75.02.07 දින අංක 150 දරණ ගැසට් පත්‍රය

---

### උඩුනුවර කඳුපළාත ගම්සභාව

#### ගෝඝාතක ආඥාපනත

මෙහි පහත දක්වෙන උපලේඛනයෙහි නම් සඳහන් අයවළුන් විසින් එහි විස්තර සඳහන් ස්ථානයෙහි 1975 වර්ෂය තුළ මස් පිණිස සතුන් මරා විකිණීම සඳහා අවසර පත්‍ර ඉල්ලා මා වෙත ඉල්ලුම්පත්‍ර එවා තිබෙන බව ගෝඝාතක ආඥාපනතේ (272 වැනි අධිකාරය වන) 7 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එම බලපත්‍ර නිකුත් කිරීම ගැන මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර කඳුපළාත ගම්ප්‍රදේශයේ ගම්සභා සීමා තුළ පදිංචි යම් කෙනෙක් විරුදධ වන්නේ නම් ඔහු හෝ ඇය එසේ විරුද්ධ වන්නේ කුමණ කරුණු නිසා ද යන වග සඳහන්කර ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට 14 දිනක් ඇතුළතදී මා වෙත එවිය යුතු බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනයන් | වෙළඳාමේ ස්වභාවය | ස්ථානය |
|---|---|---|
| 1. එම්. එල්. එම්. හනිපා මහතා, වෙලම්බොඩ ... | ... එළහරක් මස් | ... ගල්මුල්ල, වෙලම්බොඩ |
| 2. ඒ. එල්. ඒ. අසීස් මහතා, වෙලම්බොඩ ... | ... එළහරක් මස් | ... පතහදෙනිය, වෙලම්බොඩ |
| 3. ඒ. සී. එම්. හාරිස් මහතා, වටදෙනිය ... | ... එළහරක් මස් | ... අටලහතැන්න, වෙලම්බොඩ |

යූ. එල්. නූර් මොහමඩ්,
සභාපති,
උඩුනුවර කඳුපළාත ගම්සභාව.

1975 ජනවාරි මස 15 දින,
වෙලම්බොඩ, ඇල්පිටිකන්ද, උඩුනුවර කඳුපළාත
ගම්සභා කාර්යාලයේ දිය.

2-132—75.02.07 දින අංක 150 දරණ ගැසට් පත්‍රය

---

### මහනුවර දිස්ත්‍රික්කය—පාතදුම්බර පල්ලේගම්පහ දකුණ ගම්සභාව

#### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත උපලේඛනයෙහි නම් සඳහන් අය විසින් එකී උපලේඛනයේ සඳහන් පරිදි මස් වෙළඳාම පවත්වාගෙන යාම පිණිස 1975 වර්ෂයට බල පත්‍රයක් ඉල්ලුම්කර තිබෙන බවත්, ඒ අනුව බලපත්‍ර නිකුත් කිරීම ගැන පාතදුම්බර පල්ලේගම්පහ දකුණ ගම්සභා ප්‍රදේශයේ පදිංචි අයෙකු හෝ සංවිධානයක් විරුද්ධ වන්නේ නම් එසේ විරුද්ධවීමට හේතු සඳහන් කර පිටපත් දෙකකින් යුත් ලිපියක් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත ඉදිරිපත් කළයුතු බවත්, (272 වන අධිකාරය වන) ගෝඝාතක ආඥාපනතේ 7 (2) වගන්තිය යටතේ මෙයින් දැනුම්දෙනු ලැබේ.

කේ. ජී. කේ. බී. යාපා,
සභාපති,
පාතදුම්බර පල්ලේගම්පහ දකුණ ගම්සභාව.

ගම්සභා කාර්‍යාලයය,
නවයාලතැන්න,
කටුගස්තොට, 1975.01.16.

උපලේඛනය

| නම සහ ලිපිනය | ස්ථානය | ව්‍යාපාරය |
|---|---|---|
| 1. ඇම්. ඇස්. ටී. සහීඩ් මහතා, 238, කුරුදුගහඇල, අකුරණ ... | ... 238, කුරුදුගහඇල | ... ගවමස් වෙළඳාම |

2-120—75.02.07 දින අංක 150 දරණ ගැසට් පත්‍රය

## හැටන්-දික්ඔය නගර සභාව

රථවාහන හා සත්ව බද්ද—1975 වර්ෂය, නගර සභා ආඥාපනතේ (255 වැනි අධිකාරිය)

(255 වන අධිකාරිය වන) නගර සභා ආඥාපනතේ 162 වැනි ඡේදය අනුව, පහත සඳහන් උපලේඛනයේ දැක්වෙන පරිදි රථවාහන හා සතුන් බද්ද, 1975 වර්ෂයේ දී පහත සඳහන් අයුරු පනවා ඇති බවත්,

යටකී පනතේ 163 (3) වන ඡේදය යටතේ එකී බද්ද 1975 වර්ෂයේ මාර්තු 31 වෙනි දිනට හෝ ඊට පෙර ගෙවිය යුතු බවත්, හැටන් දික්ඔය නගර සභාව මෙයින් ප්‍රකාශයට පමුණුවනු ලැබේ.

ඕ. දොන් විල්ප්‍රඩ්,
හැටන්-දික්ඔය නගර සභාවේ සභාපති.

1975. 01. 16 වෙනි දින,
හැටන්-දික්ඔය නගර සභා කාර්යාලයේ දීය.

### උපලේඛනය

| | | |
|---|---|---|
| 1. මෝටර් කාර්, රෝදත්‍රයේ මෝටර් කාර්, ලොරි, මෝටර් සයිකල්, කරත්ත, අත්කරත්ත, ජින්රික්ෂෝ, බයිසිකල් හෝ ට්‍රයිසිකල් හැර වෙනත් ඕනෑම අන්දමේ වාහනයකට ... ... | 5 | 0 |
| 2. සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ රෝද දෙකේ රථයක් හෝ රෝද තුනේ රථය් හෝ කරත්තයක්— | | |
| (අ) වෙළඳාම සඳහා පාවිච්චි කරන්නේ නම් ... | 5 | 0 |
| (ආ) වෙළඳාම හැර වෙනයම් කටයුත්තක් සඳහා පාවිච්චි කරන්නේ නම් ... ... | 1 | 0 |
| 3. සෑම ගොන් දෙන්නා බඳින කරත්තයක් හෝ මොනයම් තිරික්කලයක් සඳහා ... ... | 4 | 0 |
| 4. සෑම තනි ගොනා බඳින කරත්තයක් සඳහා ... | 5 | 0 |
| 5. සෑම අත්කරත්තයක් සඳහා ... | 4 | 0 |
| 6. ජින්රික්ෂෝවක් සඳහා ... ... | 2 | 0 |
| 7. අශ්වයෙක් හෝ පෝනියෙක් සඳහා ... | 1 | 0 |
| 8. බල්ලෙකු සඳහා ... ... | 1 | 0 |
| 9. බැල්ලියෙකු සඳහා ... ... | 1 | 50 |

2–134—75.02.07 දින අංක 150 දරන ගැසට් පත්‍රය

---

## ගාල්ල මහ නගර සභාව

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත (272 අධිකාරය)

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත (272 වන අධිකාරය) 17 (1) දරණ වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලය පරිදි, නියමිත අධිකාරිතැනාවූද, ගාල්ල නගරයේ විශෙෂ කොමසාරිස් වූද, රෝලන්ඩ් ඩයස් අබේසිංහ වන මම, 1975 වර්ෂයේදී මෙහි පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් දිනයන්හි ගාල්ල නගර සීමාව තුළ, මස් පිණිස සතුන් මැරීම සහ මස් විකිණීම තහනම් කරමි.

රෝලන්ඩ් ඩයස් අබේසිංහ,
විශෙෂ කොමසාරිස්, ගාල්ල නගරය

1975 ජනවාරි 15 වන දින,
ගාල්ල නගරයේ විශේෂ කොමසාරිස්
කාර්යාලයේ දී ය.

### උපලේඛනය

1. 1975 ජනවාරි 27 දින දුරුතු පුර පසළොස්වක දින.
2. 1975 පෙබරවාරි 25 දින නවම් පුර පසළොස්වක දින.
3. 1975 මාර්තු 26 දින මැදින් පුර පසළොස්වක දින.
4. 1975 අප්‍රේල් 25 දින බක් පුර පසළොස්වක දින.
5. 1975 මැයි 22 දින ජනරජ දිනය.
6. 1975 මැයි 24 දින වෙසක් පුර පසළොස්වක දින.
7. 1975 මැයි 25 දින වෙසක් පුර පසළොස්වක දිනට පසු දින.
8. 1975 ජූනි 23 දින පොසොන් පුරපසළොස්වක දින.
9. 1975 ජූලි 22 දින ඇසළ පුරපසළොස්වක දින.
10. 1975 අගෝස්තු 21 දින නිකිනි පුර පසළොස්වක දින.
11. 1975 සැප්තැම්බර් 19 දින බිනර පුර පසළොස්වක දින.
12. 1975 සැප්තැම්බර් 26 දින බණ්ඩාරනායක සමරු දිනය.
13. 1975 ඔක්තෝබර් 4 දින ලෝක සත්ත්ව දින.
14. 1975 ඔක්තෝබර් 19 දින වප් පුර පසළොස්වක් දින.
15. 1975 නොවැම්බර් 18 දින ඉල් පුර පසළොස්වක දින.
16. 1975 දෙසැම්බර් 18 දින උඳුවප් පුර පසළොස්වක දින.

2–138—75.02.07 දින අංක 150 දරන ගැසට් පත්‍රය

---

## කටුනායක-සීදූව නගර සභාව

### ජලභීතිකා රෝගය

කටුනායක-සීදූව නගර සභා ප්‍රදේශය තුළ ජලභීතිකා උවදුර පවතින බැවින් මෙම නගර සභා ප්‍රදේශය තුළ පිහිටි පෞද්ගලික ගොඩ නැගිල්ලක, ගෙමිදුලක හෝ ගෙවත්තක නොවන්නාවූ අන්‍ය ප්‍රසිද්ධ ස්ථානයක හෝ පාරක හමුවන/දඩාවතේ යන හෝ නැතහොත් බැඳ නොතබන ලද්දාවූ හෝ දක්කාගෙන නොයනු ලබන්නාවූ කිසියම් සුනඛයකු (බල්ලකු හෝ බැල්ලියකු) මා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලබන අයෙකු විසින් එවලේම විනාශ කරනු ලබන බව ලංකාවේ ව්‍යවස්ථාපිත ප්‍රඥප්ති සංග්‍රහයේ (476 වැනි පරිච්ඡේදය වන) ජලභීතිකා ආඥාපනතේ 11 වැනි වගන්තියේ ප්‍රකාර මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

මෙම ප්‍රකාශනය 1975 ජනවාරි මස 24 වෙනි දින සිට මාස 6 ක කාලයක් බලපවත්වනවා ඇත.

ෂෙල්ටන් පැට්‍රික් පලිහවඩන,
සභාපති,
කටුනායක-සීදූව නගර සභාව.

1975 ජනවාරි මස 24 වෙනි දින,
කටුනායක-සීදූව නගර සභා කාර්යාලයේ දී ය.

2–209—75.02.07 දින අංක 150 දරන ගැසට් පත්‍රය

---

## කුරුණෑගල දිස්ත්‍රික්කය—නාතගනේ ගම්සභාව

මෙහි පහත උපලේඛනයෙහි දක්වෙන අය විසින්, එහි දැක්වෙන ස්ථානයෙහි 1975 වර්ෂයට මස් වෙළඳාම් කිරීමට බලපත්‍රයක් ඉල්ලා ඇති බවත්, මෙම බලපත්‍රය නිකුත් කිරීම ගැන කුරුණෑගල දිස්ත්‍රික්කයේ නාතගනේ ගම්සභා සීමාව තුල පදිංචි යම් අයෙක් විරුද්ධවන්නේ නම්, එසේ විරුද්ධ වීමට හේතු සටහන් කර, ඒ ගැන පිටපත් දෙකකින් යුක්තවූ ලියවිල්ලක් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14ක් ඇතුළත මා වෙත ලැබෙන්නට සැලැස් විය යුතු බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 අධිකාරය) 7 වන වගන්තිය යටතේ මෙයින් දනුම් දෙමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය | වෙළඳාම |
|---|---|---|
| එස්. ඩී. ඇම්. ඉස්මායිල්, 92/5, විල්ගොඩ, කුරුණෑගල ... ... | කටුපොත ගොඩවලගාව වත්ත ... ... | එළහරක් මස් |

ඩී. ඇම්. පුංචිබණ්ඩා,
නාතගනේ ගම්සභාවේ සභාපති.

1974 දෙසැම්බර් මස 30 වැනි දින,
නාතගනේ ගම්සභා කාර්‍යාලයේ දී ය.

2–87—75.02.07 දින අංක 150 දරන ගැසට් පත්‍රය

## කිරම ගම්සභාව—සංශෝධන

### වාර්ෂික බදු පැනවීම

කිරම ගම්සභාව විසින් 1974 ඔක්තෝබර් මස 31 වැනි දින පෙරවරු 9.30 ට කිරම ගම්සභා කාර්යාලයේදී පවත්වන ලද මාසික සභා රැස්වීමේදී සාකච්ඡා කොට සම්මත කර ගත් 1975 වර්ෂය සඳහා පනවා අය කිරීමට යෝජිත අප්‍රිය හා අන්තරාදායක කර්මාන්ත ලේඛනයට පහත සඳහන් කර්මාන්තද ඇතුලත් වන බැව් ප්‍රදේශයේ මහජනයා වෙත 257 වැනි අධිකාරය වූ ගම්සභා ආඥාපනතේ 52 වැනි වගන්තිය යටතේ 1961 අංක 60 දරණ පනතින් සංශෝධිත සම්පාදිත නියෝග මාලාවේ 4 වැනි කාණ්ඩයේ 8 (1) වැනි නියෝගය ප්‍රකාර මෙයින් දැනුම් දෙමි.

| | | රු. | ශ. |
|---|---|---|---|
| අංක 44 | ගඩොල් හෝ උළු පිළිස්සීම ... | 15 | 0 |
| අංක 45 | හුණුගල් පිළිස්සීම හා රැස්කිරීම ... | 50 | 0 |
| අංක 47 | වඩුවැඩ කරන ස්ථානයක් තබාගැනීම ... | 10 | 0 |

සී. ඩී. ඇස්. කරුණානායක,
කිරම ගම්සභාවේ සභාපති.

1975 ජනවාරි 20 වැනි දින,
කිරම ගම්සභා කාර්යාලයේ දීය.

2-206—75.02.07 දින අංක 150 දරණ ගැසට් පත්‍රය

---

## 1952 අංක 6 දරණ පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනත (261 වෙනි අධිකාරය)

1952 අංක 6 දරණ ප්‍රදේශාධිකාරි සහ (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) ආඥාපනතේ 3 වැනි වගන්තිය යටතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ නෑගම්පහ කෝරළේ ගම්සභාව විසින් සම්මත කර ගන්නා ලද පහත දැක්වෙන යෝජනාව එකී වගන්තිය ප්‍රකාර මෙයින් පළකර සිටිනු ලැබේ.

### යෝජනාව

රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු භාර ගරු ඇමතිතුමා විසින් සම්පාදනය කරනු ලැබ 1972 නොවැම්බර් මස 3 වැනි දින අංක 32 දරණ ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පල කරන ලද්දාවූද, ජාතික රාජ්‍ය සභාව විසින් 1973.04.05 වැනි දින අනුමත කරන ලද බව 1973.06.29 වැනි දින අංක 66 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දාවූද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල අංක 42 වැනි කාණ්ඩයවූ පුස්තකාල පිළිබඳ අතුරු ව්‍යවස්ථා පිළිගැනීමටත් එය ශ්‍රී ලංකා ගැසට් පත්‍රයේ පලවන දින සිට අනුරාධපුර දිස්ත්‍රික්කයේ නෑගම්පහ කෝරලේ ගම්සභා ප්‍රදේශයේ ක්‍රියාත්මක කිරීමටත් පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තියේ (iv) උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කර සිටිනු ලැබේ.

යූ. බී. විජේකෝන්,
සභාපති,
නෑගම්පහ කෝරලේ ගම්සභාව.

1975 ජනවාරි මස 16 වැනි දින,
නෑගම්පහ,
නෑගම්පහ කෝරලේ ගම්සභා කාර්යාලයේ දීය.

2-92—75.02.07 දින අංක 150 දරණ ගැසට් පත්‍රය

---

## නාත්තන්ඩිය සුළු නගර සභාව

### වරිපනම් ලේඛණ

1975 වර්ෂය වෙනුවෙන් පිළියෙල වී ඇති, නාත්තන්ඩිය සුළු නගර සභාවේ වරිපනම් ලේඛන රාජකාරි වේලාවන් තුළ මෙම කාර්යාලයේදී පරීක්ෂා කිරීම පිණිස විවෘතව ඇති බව (256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 165 වැනි වගන්තියෙන් කියවෙන (252 වැනි අධිකාරය වන) මහ නගර සභා ආඥාපනතේ 235 (1) වැනි වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඩබ්ලිව්. ඊ. ප්‍රනාන්දු,
පාලක නිලධාරී,
නාත්තන්ඩිය සුළු නගර සභාව.

1975 ජනවාරි 16 වැනි දින,
සුළු නගර සභා කාර්යාලය,
නාත්තන්ඩිය.

2-94—75.02.07 දින අංක 150 දරණ ගැසට් පත්‍රය

---

## නාත්තන්ඩිය සුළු නගර සභාව

### 1975 වර්ෂයට වරිපනම් බද්ද

සුළු නගර සභා ආඥාපනත (256 අධිකාරය) යටතේ 1974 වර්ෂයට බලපැවැත්වූ පහත සඳහන් වරිපනම් බදු 1975 වර්ෂයටද එලෙසම පැනවීමට නාත්තන්ඩිය සුළු නගර සභාවේ පාලන නිලධාරී වන මම තිරණය කර ඇති බව මෙයින් ප්‍රකාශයට පත් කරමි.

159 වැනි වගන්තිය ප්‍රකාර මෙම සුළුනගර සභාව තුළ පිහිටා තිබෙන සියළුම නිශ්චල දේපලවල වාර්ෂික වටිනාකමින් සියයට හය බැගින් වාර්ෂික බදු පිළිවෙලින් මාර්තු 31 වැනිදායින්, ජූනි 30 වැනිදායින්, සැප්තැම්බර් 30 වැනිදායින් හා දෙසැම්බර් 31 වැනිදායින් අවසන් වන අයුරු ත්‍රෛමාසික වශයෙන් ගෙවිය හැකිවේ.

ඩබ්ලිව්. ඊ. ප්‍රනාන්දු,
පාලක නිලධාරී,
නාත්තන්ඩිය සුළු නගර සභාව.

සුළු නගර සභා කාර්යාලය,
නාත්තන්ඩිය,
1975 ජනවාරි 16 වැනි දින.

2-95/1—75.02.07 දින අංක 150 දරණ ගැසට් පත්‍රය

---

## නාත්තන්ඩිය සුළු නගර සභාව

### 1975 වර්ෂයට සුනඛයින් ලියාපදිංචි කිරීමේ ගාස්තු

